# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,993 - 2016 නොවැම්බර් මස 11 වැනි සිකුරාදා - 2016.11.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2228 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2241 |



*සැ. යු.* - (i) සත්‍ය ශ්‍රී ගණපති භක්ති ජන සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ජූලි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මහිපාල හේරත් ජන සහන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 සැප්තැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) සරවන පවන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 සැප්තැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 දෙසැම්බර් මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 නොවැම්බර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 දෙසැම්බර් මස 14 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ඔක්තෝබර් මස 21 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | බියගම | බටහිර සියනෑ කෝරළය කොට්ඨාසයේ මල්වාන - යටිහේන ප්‍රදේශයේ අතිරේක මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ |

11-475

## ජාතික සමාජ සංවර්ධන ආයතනය

(සමාජ සවිබල ගැන්වීම් හා සුභ සාධන අමාත්‍යාංශය)

අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන්

01. **තනතුර : මහාචාර්ය** **තනතුරු 01**

01. වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 55ට අඩු විය යුතුය. (දැනට මෙම ආයතනයේ සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බලනොපායි.)

02. බඳවා ගැනීමේ සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින්/පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් සමාජ වැඩ/සමාජයීය විද්‍යාවන් පිළිබඳ පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත උපාධියක්;

*හෝ*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින්/පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජ වැඩ පිළිබඳ හෝ සමාජයීය විද්‍යාවන්ගෙන් ලබා ගත් පන්ති සමාර්ථයක් රහිත උපාධිය සමග සමාජ වැඩ. සමාජ සුභසාධනය, සමාජ ප්‍රතිපත්ති, උපදේශනය, සමාජ/ප්‍රජා සංවර්ධනය යන විෂයන්ගෙන් හෝ අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින්/පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් අවම වශයෙන් එක් අවුරුදු කාල සීමාවකට නොඅඩු ශාස්ත්‍රපති උපාධියක්;

*සහ*

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින්/පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජ වැඩ පිළිබඳ හෝ සමාජයීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධියක් සම්පූර්ණ කිරීම, (සමාජ වැඩ ආචාර්ය උපාධිය සඳහා ප්‍රමුඛත්වය දෙනු ලැබේ.) ;

*සහ*

(ඇ) අදාළ ආචාර්ය උපාධිය ලැබීමෙන් පසු විශ්වවිද්‍යාල මට්ටමේ ඉගැන්වීම් හා පර්යේෂණ කාර්යයන්හි අවම වශයෙන් වසර 10 ක අත්දැකීම් සමග අධ්‍යාපන පරිපාලනයෙහි ප්‍රමාණවත් අත්දැකීම්;

*හෝ*

(ඇ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 10 ක සේවා පළපුරුද්දක් සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින්/පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජ වැඩ හෝ සමාජීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධිය සම්පූර්ණ කිරීම;

*සහ*

(ඉ) ඉංග්‍රීසි භාෂාවෙන් මනා ලෙස වැඩ කිරීමට හැකියාවක් තිබීම.

03. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| ඉගැන්වීම් සඳහා දායකත්වය සහ අධ්‍යාපනික සංවර්ධනය | ලකුණු 20 |
| පර්යේෂණ හා නිර්මාණශීලි කාර්යයන් | ලකුණු 45 |
| දැනුම ව්‍යාප්ත කිරීම සහ ජාතික සංවර්ධනය | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | ලකුණු 20 |
| | ලකුණු 100 |

04. වැටුප් පරිමාණය : HM 2-3-2016 - රු. 98,215 - 12 x 2,700= රු. 130,615 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

HM 2-3-2006 - රු. 47,245 - 12- x 1,310 - රු. 62,965 (මාසිකව)

02. **තනතුර : අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන කටයුතු) - තනතුරු 01**

01. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වුවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.

02. අධ්‍යාපන සුදුසුකම් : (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජයීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධියක් සමග සමාජ වැඩ (Social Work) පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

03. පළපුරුද්ද : රජයේ හෝ රාජ්‍ය ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමණාකාර මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් සමග ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම. (මෙම සේවා කාලයෙන් අවම වශයෙන් වසර 03 ක් සමාජ වැඩ (Social Work) පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ගැනීමෙන් පසුව විය යුතුය.

04. අතිරේක වෘත්තීය සුදුසුකම් : සමාජ සේවා/සමාජ සුභ සාධන/සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ වැඩසටහන් කළමනාකරණය කිරීම හා සමාජ වැඩ වෘත්තීය ආයතනයක (Professional Body) සාමාජිකත්වය දැරීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

සුදුසුකම් : ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් සමග ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

05. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| අදාළ පරිපාලන පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක වෘත්තීය පළපුරුද්ද | ලකුණු 30 |
| වෙනත් කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | ලකුණු 25 |
| | ලකුණු 100 |

06. වැටුප් පරිමාණය : HM 2-1-2016-රු. 93,020 - 12 x 2,700 = රු. 125,420 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

HM 2-1-2006-රු. 44,030-12x1,310 - රු. 59,750 (මාසිකව)

03. **තනතුර : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුරු 04**

01. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වුවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජයීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජ වැඩ (Social Work) පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා තිබීම.

(ආ) පළපුරුද්ද :
රජයේ හෝ රජය පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක වසර 10 කට නොඅඩු සමාජවැඩ අධ්‍යයන හා ඉගැන්ම් අංශයන්හි පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා —**

(අ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ කථිකාචාර්ය I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05ක පළපුරුද්දක් ලබා තිබීම.

*හෝ*

(ආ) සමාජ වැඩ (Social Work) පිළිබඳ ආචාර්ය උපාධියක් තිබීම හා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ කථිකාචාර්ය I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක් ලබා තිබීම.

03. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | | |
|---|---|---|
| | අදාළ ක්ෂේත්‍රයේ පලපුරුද්ද | ලකුණු 30 |
| | අදාළ අතිරේක වෘත්තීය පළපුරුද්ද | ලකුණු 30 |
| | වෙනත් කුසලතා | ලකුණු 15 |
| | සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | ලකුණු 25 |
| | | ලකුණු 100 |

04. වැටුප් පරිමාණය :AR- 2-2016-රු. 71,585 - 10 x 1,910 = රු. 90,685 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

AR - 2-2006A-රු. 34,550-10x925 -රු. 43,800 (මාසිකව)

**04. තනතුර : ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරි - තනතුරු 03**

01. වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධියක් තිබීම.

*හෝ*

රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 10 කට නොඅඩු සමාජ වැඩ පුහුණු කිරීමේ අංශයන්හි පළපුරුද්දක් තිබීම.

*හෝ*

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යවන්ගෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

*හා*

03. පළපුරුද්ද : රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 15 කට නොඅඩු සමාජවැඩ පුහුණු කිරීමේ අංශයන්හි පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -**

(අ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු නිළධාරි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05ක පළපුරුද්දක් ලබා තිබීම;

*හෝ*

(ආ) සමාජීය විද්‍යාවන්ගෙන් ආචාර්ය උපාධියක් තිබීම හා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු නිලධාරි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

| | | |
|---|---|---|
| 04. සම්මුඛ පරීක්ෂණය සඳහා : | අදාළ ක්ෂේත්‍රයේ පලපුරුද්ද | ලකුණු 30 |
| ලකුණු ක්‍රමය | අදාළ අතිරේක වෘත්තීය පළපුරුද්ද | ලකුණු 30 |
| | වෙනත් කුසලතා | ලකුණු 15 |
| | සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | ලකුණු 25 |
| | | ලකුණු 100 |

05. වැටුප් පරිමාණය : AR - 2-2016-රු. 71,585 - 10 x 1,910 = රු. 90,685 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

AR - 2-2006A-රු. 34,550-10x925 - රු. 43,800 (මාසිකව)

05. **තනතුර : ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි - තනතුරු 03**

01. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් : (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සාමාජීය විද්‍යාවන්ගේ ආචාර්ය උපාධියක් ලබා තිබීම;

*හෝ*

රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 10කට නොඅඩු සමාජවැඩ පර්යේෂණ අංශයන්හි පළපුරුද්ද ලබා තිබීම;

*හෝ*

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජීය විද්‍යාවන්ගෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

*හා*

03. පළපුරුද්ද රජයේ හෝ රජය පිළිගත් ආයතනයක වසර 15කට නොඅඩු සමාජවැඩ පර්යේෂණ අංශයන්හි පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා-**

(අ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පර්යේෂණ නිලධාරි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 05ක පළපුරුද්දක් ලබා තිබීම.

*හෝ*

(ආ) සමාජීය විද්‍යාවන්ගේ ආචාර්ය උපාධියක් තිබීම හා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පර්යේෂණ නිලධාරි I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් ලබා තිබීම.

| | | |
|---|---|---|
| 04. සම්මුඛ පරීක්ෂණය සඳහා : | අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | ලකුණු 30 |
| ලකුණු ක්‍රමය | අදාළ අතිරේක වෘත්තීය පළපුරුද්ද | ලකුණු 30 |
| | වෙනත් කුසලතා | ලකුණු 15 |
| | සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | ලකුණු 25 |
| | | ලකුණු 100 |

05. වැටුප් පරිමාණය : AR 2-2016-රු. 71,585 - 10 x 1,910 = රු. 90,685 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

AR -2-2006A-රු. 34,550-10x925 - රු. 43,800 (මාසිකව)

**06. තනතුර : පර්යේෂණ නිලධාරි II - තනතුරු 01**

01. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට හෝ මෙම ආයතනයේ නියුතුවූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජීය විද්‍යාවන්ගෙන් පළමු හෝ දෙවන පංතියේ (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත පර්යේෂණ නිබන්ධනයක් සහිත උපාධිය;

*හෝ*

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ලබාගත් ප්‍රථම උපාධිය සමග පශ්චාත් උපාධියක්;

*හෝ*

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් උපාධියක් සමග රජයේ හෝ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක පර්යේෂණ සහකාරවරයෙකු ලෙස පර්යේෂණ කටයුතුවල වසර 03ක පළපුරුද්ද ලබා තිබීම.

04. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක වෘත්තීය පළපුරුද්ද | ලකුණු 30 |
| වෙනත් කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | ලකුණු 25 |
| | ලකුණු 100 |

05. වැටුප් පරිමාණය : AR -1-2016-රු. 51,285 - 5 x 1,135 - 5 x 1,335 - 15 x 1,590 = රු. 87,485 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

AR -1-2006A-24,725-5x550-5 x 645-15x770 - රු. 42,250 (මාසිකව)

**07. තනතුර : ඉංග්‍රීසි උපදේශක III - තනතුරු 01**

01. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව විෂයයක් සහිතව ලබාගත් උපාධියක්;

*හෝ*

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව, ඉංග්‍රීසි සාහිත්‍ය, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් ක්‍රමවේදය සහිත උපාධිය;

*සහ*

(ඇ) ඉංග්‍රීසි ඉගැන්වීම් පිළිබඳ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබා ගත් වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

(ඉ) ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ රජයේ පාසලක හෝ වෙනත් රජයේ උසස් අධ්‍යාපන ආයතනයක වසර 03කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

03. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| තනතුරට අදළ විෂයානුබද්ධ පළපුරුද්ද | ලකුණු 30 |
| තනතුරට අදළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් දක්ෂතා හා කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමේ කුසලතාව | ලකුණු 25 |
| | ලකුණු 100 |

04. වැටුප් පරිමාණය :MA 4-2016-රු. 37,970 - 10 x 755 - 15 x 930 - 5 x 1,135 = රු. 65,145 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

MA 4-2006A-රු. 18,230-10x365-15 x 450-5x550 - රු. 31,380 (මාසිකව)

08. **තනතුර : වැඩ සටහන් සහකාර (ස්ථානභාර)** III **- තනතුරු 01**
(කිලිනොච්චිය මධ්‍යස්ථානය සඳහා)

01. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් උපාධිය;

*සහ*

රජයේ හෝ රජයේ පිළිගත් ආයතනයකින් සමාජ වැඩ උපදේශනය හෝ සමාජ සංවර්ධනය යන විෂයන්ට අදාළ වර්ෂ 01කට නොඅඩු ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම;

*සහ*

(ආ) රජයේ හෝ පිළිගත් ආයතනයක මධ්‍යස්ථානභාර කටයුතු පිළිබඳව අවම වශයෙන් එක් අවුරුද්දක පළපුරුද්දක්.

**අභ්‍යන්තර අයදුම්කරුවන් -**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධිය සමග රජයේ හෝ රජයේ පිළිගත් ආයතනයකින් සමාජ වැඩ, උපදේශනය හෝ සමාජ සංවර්ධනය යන විෂයන්ට අදළ වර්ෂ 01කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් ලබා තිබීම;

*සහ*

(ආ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ කළමනාකරණ සහකාර තනතුරක අවුරුදු පහක (05) පළපුරුද්දක්.

03. වැටුප් පරිමාණය : MA 3-2016-රු. 32,200-10 x 445-11 x 660 - 10 x 730 - 5 x 750 - රු. 54,960 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 වැනි දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 1 උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

MA 3-2006A - රු. 15,600 - 10 x 215 - 4 x 240 - 15 x 320 - 7 x 360 - රු. 26,030 (මාසිකව)

09. **තනතුර : භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) III - තනතුරු 01**

01. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 22ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (දැනට රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම්

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සිංහල/ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා ගත් උපාධියක් සහ අ. පො. ස. උසස්පෙළ සිංහල හා ඉංග්‍රීසි භාෂාව/සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා ගැනීම සහ සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්තනය පිළිබඳ නිපුනතාවය;

*සහ*

(ආ) රජයේ හෝ රජය පිළිගත් ආයතනයක සිංහල/ඉංග්‍රීසි භාෂා පරිවර්තකයෙකු ලෙස වසර 02 ක පළපුරුද්ද.

03. බඳවා ගැනීමේ ක්‍රමය : පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ඉහලම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

04. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| තනතුරට අදළ විෂයානුබද්ධ පළපුරුද්ද | ලකුණු 30 |
| තනතුරට අදළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් දක්ෂතා හා කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමේ කුසලතාව | ලකුණු 25 |
| | ලකුණු 100 |

05. වැටුප් පරිමාණය : MA -4-2016-රු. 37,970 - 10 x 755 - 15 x 930 - 5 x 1,135 = රු. 65,145 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 වැනි දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 I උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

MA 4-2006A-රු. 18,230-10x365-15 x 450-5x550 - රු. 31,380 (මාසිකව)

10. **තනතුර : ශ්‍රව්‍යදෘශ්‍ය කාර්මික III - තනතුරු 01**

01. වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 22ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනට මෙම ආයතනයේ සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.)

02. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සහිතව එක්වරක දී විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධක මට්ටම ලබා තිබීම.

(ඇ) තාක්ෂණික නිපුනතා/ප්‍රවීණතා
එක් එක් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමට අඩු නොවන්නාවූ ශ්‍රව්‍යදෘශ්‍ය කාර්මික තාක්ෂණික පාඨමාලාවක් සාර්ථකව හදරා සහතික ලබා තිබීම.

03. වැටුප් පරිමාණය : MA-2-2-2016-30,310 - 10 x 300 - 7 x 350 - 4 x 600 - 20 x 710 = 52,360 (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 1 උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

MA-2-2-2006A - 14,610 - 10 x 145 - 7 x 170 - 4 x 290 - 20 x 345 - 25,310 (මාසිකව)

11. **තනතුර** : **නේවාසිකාගාර පාලක III තනතුරු 01**

1. වයස් සීමාව : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (දැනට මෙම ආයතනයේ සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බලනොපායි.)

2. අධ්‍යාපන සුදුසුකම් (අ) සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව තව විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම හා සමාජ වැඩ, උපදේශනය හෝ සමාජ සංවර්ධනය විෂයන්ට අදල වර්ෂ 01කට නොඅඩු ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් —

1. අධ්‍යාපන සුදුසුකම්

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි පහත ආ, ඇ, ඉ. සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එක් වරකදී පළමු භාෂාව සහ ගණිතය යන විෂයයන් දෙකට සම්මාන සහිතව විෂයයන් හයකට (06) නොඅඩුව සමත්ව තිබීම සහ සමාජ වැඩ, උපදේශනය හෝ සමාජ සංවර්ධනය විෂයයන්ට අදල වර්ෂ 01කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් ලබා තිබීම.

(පරිගණක වදන් සැකසුම/යතුරු ලියනය පිළිබඳ තෘතිය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අදළ අවස්ථාවන්හිදී සුදුසුකම් වශයෙන් ඇතුලත් කරනු ලැබිය හැක.)

(ඇ) සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

03. වැටුප් පරිමාණය : MA-1-2-2016-27,910 - 10 x 300 - 7 x 350 - 12 x 600 - 12 x 710= රු. 49,080/= (මාසිකව) වැටුප් පරිමාණයක් හිමි වේ. (2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය 02/2016 1 උපලේඛනය පරිදි) එම චක්‍රලේඛයේ උපලේඛන II පරිදි වැටුප් ගෙවනු ලැබේ.

MA-1-2-2006A - 13,450 - 10 x 145 - 7 x 170 - 12 x 290 - 12 x 345 - 23,710/= (මාසිකව)

සියලුම තනතුරු සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි -

1. තනතුර ස්ථිරය.
2. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
3. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

සටහන : මෙම තනතුරු පුරප්පාඩුව පවතින්නේ ප්‍රධාන කාර්යාලයේ හා කිලිනොච්චි කාර්යාලයේ වන අතර තෝරා ගන්නා වැඩසටහන් සහකාර, කළමනාකරණ සහකාර, රියදුරු හා කාර්යාල සහායකයන් පහත සඳහන් ලිපිනයේ ඇති ප්‍රධාන කාර්යාලයේ හා කිලිනොච්චි කාර්යාලයේ සේවය කල යුතුය.

සේවා කොන්දේසි : 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධි විධාන වලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීති රීති හා රෙගුලාසි වලට යටත් විය යුතුය.

බඳවා ගැනීමේ ක්‍රමවේදය : පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ඉහලම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීවදත්ත තොරතුරු ඇතුලත් අයදුම්පත් පහත දක්වා ඇති ලිපිනයට 2016.12.09 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර හා සේවය කිරීමට බලාපොරොත්තු වන කාර්යාලය ලිපිකවරයේ වම්පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අපැහැදිලි හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරින් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කල යුතුය.

ආචාර්ය රිඩ්ලි ජයසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

2016 ඔක්තෝබර් මස 24 වැනි දින,
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
අංක 488 ඒ, නාවල පාර, රාජගිරිය.

11-476

---

## නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

## කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

### කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ 2 සේවා ගණයේ නේවාසිකාගාර පාලිකා තනතුරෙහි III ශ්‍රේණිය සඳහා (විවෘත) බඳවා ගැනීම - 2016

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ 2 සේවා ගණයේ නේවාසිකාගාර පාලිකා තනතුරෙහි පවතින පුරප්පාඩුවට සුදුස්සකු තෝරා ගැනීම සඳහා අදල සුදුසුකම් සම්පූර්ණ කරන ලද කාන්තා අයදුම්කාරියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තෝරාගන්නා අයදුම්කාරිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ යටතේ ඇති කුලියාපිටිය කාර්මික විද්‍යාලයේ පවතින පුරප්පාඩුව සඳහා අනුයුක්ත කරනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් පහත උපදෙස් අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂ ජනරාල්, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව තැ. පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ - 10 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. කවරයේ වම්පස උඩ කෙළවරේ '' නේවාසිකාගාර පාලිකා තනතුර සඳහා බඳවා ගැනීම '' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016.12.11 වැනි දින වේ.

සටහන.-ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කාරියන් විසින්ම විඳ දරාගත යුතුය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

" ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලබන අතර සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ."

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| අතිරේක වෘත්තීය සුදුසුකම් | 35 |
| අතිරේක පළපුරුද්ද | 30 |
| භාෂා ප්‍රවීණතාවය | 10 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 |
| එකතුව | 100 |

2. *අධ්‍යාපන සුදුසුකම් :*

1. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයන් හය (06) කින් අ. පො. ස. (සා.පෙ.) විභාගය සමත්ව තිබීම;

සහ

2. අ.පො.ස (උ.පෙ.) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම;

3. *වෘත්තීය සුදුසුකම් :*
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් කළමනාකරණය පිළිබඳව ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) පූර්ණ කාලීන 4 වන මට්ටමේ පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

4. *සේවා පළපුරුද්ද :*
රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක අදාළ තනතුරේ/ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද ලබා තිබීම.

5. *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂිකාවකම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

6. *වයස් සීමාව :*
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

7. *වෙනත් සුදුසුකම් :*
(i) අයදුම්කාරියන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
(ii) අයදුම්කාරියන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

8. *වැටුප් පරිමාණය :*
මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයේ උපලේඛනය I අනුව MN – 1 – 2016 රු. 27,140 – 10 x 300 – 11 x350 – 10 x 495 – 10 x 660 – රු. 45,540/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිවේ. තව ද එම චක්‍රලේඛයේ උපලේඛනය II අනුව අදාළ වැටුපෙහි පිහිටුවනු ලැබේ.

9. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

(i) ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 01 සිට 07 දක්වා පළමුවන පිටුව ද, අංක 08 සිට 10 දක්වා දෙවැනි පිටුවට ද අනිකුත් කරුණු ඊළඟ පිටුවලට ද වන සේ සකස් කර තම අත්අකුරින්ම නිසි ලෙස සම්පූර්ණ කළ යුතු ය.

(ii) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් සහ භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. තැපැල් මාර්ගයෙන් එවීමේ දී සිදුවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල්වේලා ඇතිව ඉල්ලුම්පත් තැපැල් කිරීමට අයදුම්කාරියන්ට උපදෙස් දෙනු ලැබේ.

(iii) සෑම අයදුම්කාරියකම තම අත්සන රජයේ විද්‍යාලක විදුහල්පතිවරයකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, 3/2016 අනුව MN – 7 ආරම්භක පියවර හෝ ඊට ඉහළ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(iv) රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කාරියන් තම අයදුම්පත් තමන් සේවය කරන ආයතනයේ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(v) ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරු බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා

අනන්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිළධාරිණියන් වසර තුනක (03) ක පරිවාස කාලයකට යටත් වන අතර එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි විධිවිධානයන්ට අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ අදාල ප්‍රවීණතා මට්ටම ලබා ගත යුතුය.

(iv) පත්වීම් ලබන නිලධාරිණියන් අවශ්‍යතාවය පරිදි නේවාසිකාගාරයේ රැඳී සිටීම අවශ්‍ය වේ.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලටද මෙම පත්වීම යටත් වේ.

11. පුරප්පාඩු පිරවීමේ අයිතිය කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සතුවේ.

12. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේය.

ජේ. ඒ. රංජිත්,
අධ්‍යක්ෂ ජනරාල්.

2016 නොවැම්බර් මස 11 වැනි දින,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව,
කොළඹ - 10.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත්‍රය

**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ 2 සේවා ගණයේ නේවාසිකාගාර පාලිකා තනතුරෙහි III ශ්‍රේණිය සඳහා (විවෘත) බඳවා ගැනීම - 2016**

1. අයදුම්කරුගේ නම :
   (i) මුලකුරු අගට යොදු මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
   (ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
   (iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. ලිපිනය හා දුරකථන අංකය :
   (i) කාර්යාලීය ලිපිනය :————.
   දුරකථන අංකය :————.
   (ii) පෞද්ගලික ලිපිනය :————.
   දුරකථන අංකය :————.
   (ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක් වුවහොත්, වහාම දැන්විය යුතුය.)

3. උපන් දිනය :
   අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
   අවුරුද්ද :————. මාස :————. දින :————.

5. ජාතික හැඳුනුම්පත් අංකය :————.

6. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

7. විවාහක/අවිවාහක/වැන්දඹු ද යන වග :————.

8. අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (සා.පෙ.) විභාගය

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ. පො. ස. (උ. පෙ.) විභාගය

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |

9. වෘත්තීය සුදුසුකම් : -

| විභාගය/ඩිප්ලෝමාව | වර්ෂය | පෙනී සිටි විෂයයන් | සාමාර්ථය | ආයතනයේ/ විශ්ව විද්‍යාලයේ නම |
|---|---|---|---|---|
| | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තරය : -

| සේවය කළ ආයතනය | තනතුර | සේවය කළ කාලය | රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක ද යන වග |
|---|---|---|---|
| | | | |

11. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් පෙළපතින් ද/ලියාපදිංචි කිරීමෙන් ද යන්න සඳහන් කරන්න. (ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න) :————.

12. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහකර තිබේ ද ? :————.

13. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම් ඔබට විරුද්ධව දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කිසිවක් තිබේ ද ? :————

14. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ නිවැරදි නොවන බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් නුසුදුස්සෙක් වීමට යටත්වන බවත් පත්කිරීමෙන් පසු ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................... මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත් ඇය .........................දින මා ඉදිරිපිට දී ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

(මෙම කොටස අදාළ වනුයේ රජයේ රැකියාවක නියුක්ත වූවන්ට පමණි.)

**දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ සේවය කරන ............................................................... මිය/මෙනවිය දැනට ................................................................................ තනතුරේ සේවය කරන බවත්, ඇයගේ වැඩ සහ හැසිරීමත් සතුටුදායක වන බවත් විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, ඒ පිළිබඳව කටයුතු කිරීමට අදහස්කර නොමැති බවත් සහතික කරමි. ඇය මෙම තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකි ය/නොහැකි ය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ බලය පැවරුණු
නිලධාරියාගේ අත්සන.

දිනය :————.
(නිල මුද්‍රාව)

11-518

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

**ජාතික වෘත්තීය පුහුණු ආයතනය - රත්මලාන**

***පාඨමාලා සඳහා බඳවා ගැනීම - 2017***

| | *පූර්ණ කාලීන පාඨමාලා* | *NVQ මට්ටම* | *කාලය (මාස)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1. | යන්ත්‍රන ශිල්පී - Machinist (General) | NVQ 04 | 12 | අ. පො. ස. (සා. පෙළ) විෂයයන් 06කින් සමත් වීම. |
| 2. | විදුලි කාර්මික ශිල්පී (කර්මාන්ත) Electrician (Industrial) | NVQ 04 | 12 | |
| 3. | ශීතකරණ හා වායුසමීකරණ ශිල්පී Ref & Air conditioning Mechanic | NVQ 04 | 12 | |
| 4. | මෝටර්රථ විදුලි කාර්මික ශිල්පී Automobile Electrician | NVQ 04 | 12 | |
| 5. | සැලසුම් ශිල්පී - Draughtsperson | NVQ 04 | 12 | |
| 6. | ග්‍රැෆික් නිර්මාණ ශිල්පී Computer Graphic Designer | NVQ 04 | 06 | |
| 7. | පරිගණක දෘඪාංග ශිල්පී Computer Hardware Technician | NVQ 04 | 06 | |
| 8. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී - Information and Communication Technology Technician | NVQ 04 | 06 | ගණිතය, ඉංග්‍රීසි සම්මාන සහිතව අ. පො. ස. (සා. පෙළ) විෂයයන් 06කින් සමත් වීම. |
| 9. | වායුපීඩන තාක්ෂණ ශිල්පී - Pneumatic Technician | NVQ 04 | 12 | අ. පො. ස. (සා. පෙළ) ගණිතය, විද්‍යාව ඇතුළුව විෂයයන් 06කින් සමත්වීම. |

| | *පූර්ණ කාලීන පාඨමාලා* | *NVQ මට්ටම* | *කාලය (මාස)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 10. | ඇළුමිනියම් පිරිසැකසුම් ශිල්පී - Aluminium Fabricator | NVQ 04 | 06 | අ. පො. ස. (සා. පෙළ) පෙනී සිටීම |
| 11. | වඩු කාර්මික ශිල්පී (ගොඩනැගිලි) Wood Craftsman (Building) | NVQ 03 | 06 | |
| 12. | ඉදිකිරීම් ශිල්පී (පෙදරේරු) Construction Technician (Mason) | NVQ 03 | 06 | 9 වසර සමත්වීම. |
| 13. | උද්‍යාන අලංකරණ ශිල්පී - Landscaping | NVQ 04 | 06 | |
| 14. | මෝටර් රථ වැද්දුම් ශිල්පී - Automobile Tinker | NVQ 04 | 06 | |
| 15. | පෑස්සුම් ශිල්පී - Welder | NVQ 04 | 12 | අ. පො. ස. (සා. පෙළ) විෂයන් 03කින් සමත්වීම |
| 16. | ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමාව Diploma in Quantity Surveyor | NVQ 05 | 12 | ගණිත/විද්‍යා/තාක්ෂණවේදය අංශයෙන් අ. පො. ස. (උ.පෙළ) විෂයයන් 02ක් සමත්වීම හෝ NVQ 4 සහතිකය ලබාතිබීම. |

අපෙන් ඔබට . . . . . . . .

- NVQ මගින් තාක්‍ෂණ උපාධිය සඳහා ප්‍රවේශවීමේ අවස්ථාව
- ස්වයං රැකියා සඳහා රු. 5,00,000/- දක්වා ණය පහසුකම්
- දෙස් විදෙස් රැකියා අවස්ථා
- වෘත්තීය උපදේශන සේවාවන්
- නේවාසික පහසුකම්
- වෘත්තීය ඉංග්‍රීසි දැනුම/ශිල්පීය ප්‍රවර්ධන දැනුම
- නායකත්ව පුහුණුව
- මූලික පරිගණක දැනුම
- ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන්
- 11, 12, 13, 15 පාඨමාලා සඳහා මාසිකව ආධුනික දීමනා.
- ප්‍රවාහන පහසුකම්

**දැනටමත් ක්ෂේත්‍රයේ නියුතු ඔබට අපෙන් . . . .**

- RPL මගින් NVQ සහතිකයක්

**පාඨමාලාව සඳහා යොමු වීම**

ඔබ විසින් සකස්කරගත් අයදුම්පතක් (නම, ලිපිනය, දුරකථන අංකය, කැමති පාඨමාලාව (පූර්ණ කාලීන/අර්ධ කාලීන), අධ්‍යාපන සුදුසුකම් ඇතුළත්ව 2017.01.07 දිනට පෙර යොමු කරන්න.

**අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය :**

සහකාර අධ්‍යක්ෂ, ජාතික වෘත්තීය පුහුණු ආයතනය, අංක 100, කඳවල පාර, රත්මලාන.
විමසීම් : 011 2638850, 0719476747
ඊමේල් : nvtirathmalana@vtasl.gov.lk

- දෙසැම්බර් 21, 28 සහ ජනවාරි 04, 11 දිනයන්හි සම්මුඛ පරීක්‍ෂණ.
- ප්‍රථමයෙන් ලැබෙන අයදුම්පත් සඳහා ප්‍රමුඛතාවය

*අර්ධ කාලීන පාඨමාලා* : (පැය 100)

* විදුලි කාර්මික     * පරිගණක     * ශීතකරණ හා වායු සමීකරණ

* සෑම වසරකම ජනවාරි මස සහ ජූලි මස මුල් දෙසතිය තුළ ආධුනිකයින් බඳවා ගැනීම සිදුකෙරේ.

11-619

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙහි II ශ්‍රේණියේ භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි), (දෙමළ/ඉංග්‍රීසි), (සිංහල/දෙමළ) තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත/සීමිත තරග විභාගය - 2016

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකේය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) - තනතුරු 08
භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රීසි) - තනතුරු 02
භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) - තනතුරු 10

02. *මාසික වැටුප් පරිමාණය.*—රු. 36,585 - 10 x 660 - 11 x 755 - 15 x 930 - රු.65,440 (MN-6-2016)

03. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

04. බඳවා ගැනීමේ අනුපාතය :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 75% |
| සීමිත | 25% |
| කුසලතා | අදාළ නොවේ. |

*සටහන.*—විවෘත ධාරාව යටතේ බඳවා ගැනීම සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම්, එම පුරප්පාඩු සංඛ්‍යාව සීමිත ධාරාව යටතේ පුරවනු ලැබේ.

සීමිත ධාරාව යටතේ සුදුසුකම් සහිත අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැතිවිට, එම පුරප්පාඩු සංඛ්‍යාව විවෘත ධාරාව යටතේ පුරවනු ලැබේ.

05. *සුදුසුකම්.*—II ශ්‍රේණියේ භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි), (දෙමළ/ඉංග්‍රීසි) හා (සිංහල/දෙමළ) තනතුරු (සීමිත/විවෘත) සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

5.1 භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) :

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සිංහල භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස සමත්ව ලබාගත් උපාධියක් තිබීම;

*සහ*

(i) උපාධිය සඳහා සිංහල භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව හා සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(ii) උපාධිය සඳහා සිංහල භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ. පො. ස. (උ. පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් 'භාෂා පරිවර්තන ක්‍රම' විෂයයක් ලෙස සමත්ව ලබාගත් උපාධියක් තිබීම;

*සහ*

(i) අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හා සිංහල භාෂාව හා සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම හා අ. පො. ස. (උ.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

03. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන (පණ්ඩිත) උපාධිය ලබා තිබීම.

*සහ*

(i) අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථ්‍යයක් ලබා තිබීම;

*හෝ*

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා යටත් පිරිසෙන් සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම.

**භාෂා පරිවර්තක** (දෙමළ/ඉංග්‍රීසි) :

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් දෙමළ භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව හෝ විෂයයක් ලෙස සමත්ව ලබා ගත් උපාධියක් තිබීම;

*සහ*

(i) උපාධිය සඳහා දෙමළ භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව /ඉංග්‍රීසි සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ. පො. ස.(සා. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව හා සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථ්‍යක් ලබා තිබීම.

*හෝ*

(ii) උපාධිය සඳහා දෙමළ භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ. පො. ස. (උ.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම;

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් 'භාෂා පරිවර්තන ක්‍රම' විෂයයක් ලෙස සමත්ව ලබාගත් උපාධියක් තිබීම;

*සහ*

(i) අ. පො. ස (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථ්‍යක් ලබා තිබීම හා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව හා සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථ්‍යයක් ලබා තිබීම;

*හෝ*

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම හා අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම;

**භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් දෙමළ භාෂාව හෝ සිංහල භාෂාව හෝ විෂයයක් ලෙස සමත්ව ලබා ගත් උපාධියක් තිබීම;

සහ

(i) උපාධිය සඳහා දෙමළ භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව හා සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා සිංහල භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ. පො. ස.(සා. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව හා සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.;

හෝ

(ii) උපාධිය සඳහා දෙමළ භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ. පො. ස. (උ.පෙළ) විභාගයේ දී සිංහල භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා සිංහල භාෂාව විෂයයක් ලෙස සමත් අයදුම්කරුවන්, අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම;

හෝ

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් 'භාෂා පරිවර්තන ක්‍රම' විෂයයක් ලෙස සමත්ව ලබාගත් උපාධියක් තිබීම;

සහ

(i) අ. පො. ස (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව හා සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථ්‍යයක් ලබා තිබීම හා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව හා සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම;

හෝ

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම හා අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථ්‍යයක් ලබා තිබීම;

03. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන (පණ්ඩිත) උපාධිය ලබා තිබීම.

සහ

(i) අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථ්‍යයක් ලබා තිබීම.

හෝ

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

5.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවෙහි ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

5.3 වෙනත් :

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
2. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
3. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

5.4 දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් ස්ථිර පත්වීම් දරන එම පත්වීම් ස්ථිර කරනු ලැබ සිටින නිලධාරීන් විය යුතුය.

06. සේවා කොන්දේසි :

(i) පත්කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ පිරවීමට රාජ්‍ය භාෂා කොමසාරිස්ට බලය ඇත.

(ii) තනතුරට පත් වී වසර තුන (03) ක් ගතවීමට පෙර පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

(iii) පත්වීම ලැබ වසර පහ (05) ක් ගතවීමට පෙර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 පරිදි භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

(iv) තෝරා ගන්නා අයදුම්කරුවන් පත් කිරීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1586/30 හා 2009.02.20 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අදාළව තනතුරේ II ශ්‍රේණියට බඳවා ගැනේ.

(v) සියලුම බඳවා ගැනීම්, අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියට හා ඉදිරියේ දී එම බඳවා ගැනීමේ පරිපාටියට කරනු ලබන සංශෝධනයන්ට යටත් වේ.

(vi) රාජ්‍ය සේවයේ යෙදී සිටින නිලධාරීන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

07. වයස් සීමාව :
විවෘත : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතු ය.
සීමිත : අදාළ නොවේ.

08. බඳවා ගැනීමේ ක්‍රමය.—ලිඛිත විභාගයක ප්‍රතිඵල මත බඳවා ගනු ලබන අතර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කෙරේ.

8.1 විභාගයේ විෂයයන් :

| | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 1. පරිවර්තනය - සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 2. පරිවර්තනය - ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 3. සිංහල භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| | 4. ඉංග්‍රීසි භාෂාව | පැය 1 1/2 | 100 | 40% |

| | ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රීසි) | 1. පරිවර්තනය - දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 2. පරිවර්තනය - ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 3. දෙමළ භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| | 4. ඉංග්‍රීසි භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 1. පරිවර්තනය - සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 2. පරිවර්තනය - දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | පැය 03 | 100 | 40% |
| | 3. සිංහල භාෂාව | පැය 1 1/2 | 100 | 40% |
| | 4. දෙමළ භාෂාව | පැය 1 1/2 | 100 | 40% |

8.2 විෂය නිර්දේශය :

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) | 1. පරිවර්තනය - සිංහල භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | * පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්‍ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් සිංහල භාෂා මාධ්‍යයෙන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයට පරිවර්තනය. |
| | 2. පරිවර්තනය - ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට | * පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්‍ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය කිරීම. |
| | 3. සිංහල භාෂාව | * රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්‍ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථය නිරූපණය වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම, අක්‍ෂර වින්‍යාසය. |
| | 4. ඉංග්‍රීසි භාෂාව | * රචනයක් ලිවීම, දෙන ලද වචන යොදා ඒවායේ අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය තැනීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම, සංයුක්ත හා සංකීර්ණ වාක්‍ය ඛණ්ඩ විග්‍රහ කිරීම. |
| භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රීසි) | 1. පරිවර්තනය - දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට | * පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්‍ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් දෙමළ භාෂා මාධ්‍යයෙන් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයට පරිවර්තනය. |
| | 2. පරිවර්තනය - ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට | * පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්‍ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් දෙමළ භාෂා මාධ්‍යයට පරිවර්තනය. |
| | 3. දෙමළ භාෂාව | * රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්‍ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථය නිරූපණය |

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| | | වන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාක් සම්ප්‍රදායන් තේරුම් කිරීම, අක්ෂර වින්‍යාසය. |
| | 4. ඉංග්‍රීසි භාෂාව | * රචනයක් ලිවීම, දෙන ලද වචන යොදා ඒවායේ අර්ථ පැහැදිලිවන සේ වාක්‍ය තැනීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම, සංයුක්ත හා සංකීර්ණ වාක්‍ය ඛණ්ඩ විග්‍රහ කිරීම. |
| භාෂා පරිවර්තක (සිංහල/දෙමළ) | 1. පරිවර්තනය - දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට | * පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් දෙමළ භාෂා මාධ්‍යයෙන් සිංහල භාෂා මාධ්‍යයට පරිවර්තනය. |
| | 2. පරිවර්තනය - සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවට | * පරිපාලනමය, නෛතික, විද්‍යාත්මක, තාක්ෂණික, සෞන්දර්ය, සාහිත්‍ය හා ආගමික ලේඛනවලින් තෝරාගත් ඡේද 03ක් සිංහල භාෂා මාධ්‍යයෙන් දෙමළ භාෂා මාධ්‍යයට පරිවර්තනය. |
| | 3. සිංහල භාෂාව | * රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථය නිරූපණයවන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම, අක්ෂර වින්‍යාසය. |
| | 4. දෙමළ භාෂාව | * රචනයක් ලිවීම, සාරාංශයක් ලිවීම, දෙන ලද ඡේදයක් සංක්ෂිප්ත කොට තම වචනයෙන් ප්‍රකාශ කිරීම, වචනවල අර්ථය නිරූපණයවන ලෙස වාක්‍ය තැනීම, වාක්‍යයන්හි ව්‍යාකරණ නිවැරදි කිරීම, වාග් සම්ප්‍රදායන් තේරුම් කිරීම, අක්ෂර වින්‍යාසය. |

09. ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.—අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරු විසින් ඉදිරිපත්කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කළ හැකිය. සෑම අයදුම්කරුවෙකුටම රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවක් හෝ ඇති වුවහොත්, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

11. විභාග ගාස්තු.—විභාග ගාස්තුව රු.1,000කි. මෙම මුදල භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-99-00 යටතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (එහි ඡායා පිටපතක් තමන් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) කිසිම හේතුවක් නිසා විභාගය සඳහා ගෙවන ලද මුදල ආපසු ගෙවනු නොලැබේ.

12. ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිවැරදිව තොරතුරු සැපයිය යුතුය. මෙම බඳවා ගැනීමේ පරීක්ෂණයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ පැවැත්වෙද්දී හෝ පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරු විසින් ඉදිරිපත්කරන තොරතුරු ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය රජයේ සේවයෙන් පහකිරීමට හැකිය.

13. අයදුම්පත්‍ර A4 (සෙ. මී. 24 x 29) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(අ) අංක 1 සිට 3.4 තෙක් ඡේදයන් පළමු පිටුවට ද;

(ආ) අංක 4 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතුය.

(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් නම සිංහල භාෂාවෙන් යුතු අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ භාෂාවෙන් යුතු අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතුය. අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය.

(13.1) අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) (දෙමළ/ඉංග්‍රීසි) හා (සිංහල/දෙමළ) තනතුර සඳහා බඳවා ගැනීම - 2016" යන්න සඳහන් කරන්න.

(13.2) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2016.12.14 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ.

රාජ්‍ය භාෂා කොමසාරිස්,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව,
අංක 341/7, භාෂා මන්දිරය,
කෝට්ටේ පාර,
රාජගිරිය.

(13.3) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සමාදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයකු, වාර්ෂික වැටුප රු. 2,92,080 ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කර තිබිය යුතුය.

(13.4) දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

14. අපේක්ෂකයාගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් තීරණය කරනු ඇත. අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

නීතිඥ ඩබ්. ඒ. ජයවික්‍රම,
රාජ්‍ය භාෂා කොමසාරිස්,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

2016 ඔක්තෝබර් මස 27 වැනි දින,
අංක 341/7, භාෂා මන්දිරය,
කෝට්ටේ පාර,
රාජගිරිය.

ආදර්ශ අයදුම්පත්‍රය

**භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි), (දෙමළ/ඉංග්‍රීසි), (සිංහල/දෙමළ) තනතුර සඳහා අයදුම්පත්‍රය**

Application for the Post of Translator (Sinhala/English) (Tamil/English) and (Sinhala/Tamil)

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

අයදුම්කරන තනතුර : (අදාළ අංකය සඳහන් කරන්න.)
01. භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි)
02. භාෂා පරිවර්තක (දෙමළ/ඉංග්‍රීසි)
03. භාෂා පරිවර්තක (සිංහල/දෙමළ)

01. නම :
1.1. මුලකුරු සමඟ නම : Mr./Mrs./Miss :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.2 සම්පූර්ණ නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————. (සිංහලෙන්/දෙමළෙන්)
1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

02. ලිපිනය :
2.1 ස්ථිර ලිපිනය :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 රාජකාරී ලිපිනය :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.3 රාජකාරී ලිපිනය :————. (සිංහලෙන්/දෙමළෙන්)
2.4 ප්‍රවේශපත් එවිය යුතු ලිපිනය :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.5 දුරකථන අංකය :————.
2.6 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
2.7 පදිංචිව සිටින කාල සීමාව :————.
2.8 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :————.

03. 3.1 ස්ත්‍රී පුරුෂ භාවය : ස්ත්‍රී -1 පුරුෂ - 0
(අදාළ අංකය ලියන්න)

3.2 විවාහක/අවිවාහක බව : විවාහක - 1
අවිවාහක - 2
(අදාළ අංකය ලියන්න)

3.3 උපන් දිනය :
වර්ෂය : මාසය : දිනය :

3.4 2016.11.11 වැනි දිනට වයස :
අවුරුදු : මාස : දින :

4. අධ්‍යාපන සුදුසුකම් :

4.1 (*a*) උපාධිය :————.
(*b*) උපාධිය ලබාගත් වර්ෂය හා විශ්වවිද්‍යාලය :————.
(*c*) උපාධියට හැදෑරූ විෂයයන් :————.

4.2 අ. පො. ස. (උ. පෙළ) :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයයන් | සාමාර්ථ්‍යය |
|---|---|
| | |
| | |
| | |
| | |

4.3 අ. පො. ස. (සා. පෙළ) :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| විෂයය | සාමාර්ථ්‍යය | විෂයය | සාමාර්ථ්‍යය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

5. ඔබ කවරදාක හෝ යම්කිසි චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

ඔව් නැත

ඔව් නම් ඒ පිළිබඳ තොරතුරු :————.

6. විභාග ගාස්තු :
   (i) විභාග ගාස්තුව ගෙවන ලද කාර්යාලය :————.
   (ii) ලදුපත් අංකය හා දිනය :————.
   (iii) ගෙවූ මුදල :————.

| විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න) |
|---|

7. *අයදුම්කරුගේ සහතිකය :*

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, මෙම බඳවා ගැනීමේ පරීක්‍ෂණයේ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් පරීක්‍ෂණය පැවැත්වීමට පෙර හෝ එය පැවැත්වෙද් දී හෝ ඉන් පසු හෝ මාගේ අපේක්‍ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මා එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

**අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති .......................... නමැති අය මා පෞද්ගලිකව හොඳින් දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව

(දැනට රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ................................ මයා./මිය./මෙනවිය .................. දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත් ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත්, ඉහත සඳහන් තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පෞද්ගලිකවම පරීක්‍ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, 2016 .........මස ......... දින ඔහු/ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි. තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් මුදාහැරිය හැකි ය./නොහැකි ය.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.

නම :————.
තනතුර :————.
නිල මුද්‍රාව

11-558

---

**ආපදා කළමනාකරණ අමාත්‍යාංශය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ
ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි
(III ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

1.0 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි, පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි (III ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 තනතුරු නාමය : විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි

1.2 තනතුරෙහි රාජකාරි ස්වභාවය

සියලු විදුලි සහ රේඩාර් උපකරණ නඩත්තුව සහ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම
පරිගණක පද්ධති, අන්තර්ජාල අළුත්වැඩියා කිරීම්
දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් පවරනු ලබන වෙනත් කාර්යයන්

2.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 *වැටුප :*

වගුව - අංක 01

| *ශ්‍රේණිය* | *වැටුප් පරිමාණය* | *ආරම්භක මාසික වැටුප* |
|---|---|---|
| III ශ්‍රේණිය | මාසිකව රු.31,040 -10x445 -11 x 660-10x730 -10x750 -රු. 57,550/-<br>(එම්එන් 3 - 2016) | රු.18,212/-<br>(රා. ප. ච.03/2016 හි උපලේඛන II විධිවිධාන අනුව) |
| II ශ්‍රේණිය | මාසිකව රු.31,040 -10x445 - 11 x 660-10x730 -10x750 -රු. 57,550/-<br>(12 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ)<br>(එම්එන් 3 - 2016) | රු.21,218/-<br>(රා. ප. ච.03/2016 හි උපලේඛන II විධිවිධාන අනුව) |
| I ශ්‍රේණිය | මාසිකව රු.31,040 -10x445 -11 x 660 10x730 -10x750 - රු. 57550/-<br>(23 වන වැටුප් පියවරෙන් ආරම්භ වේ)<br>(එම්එන් 3 - 2016) | රු.25,532/-<br>(රා.ප.ච.03/2016 හි උපලේඛන II විධිවිධාන අනුව) |

4.0 *තනතුරෙහි සේවා කොන්දේසි :*

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගත යුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුයි. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වන අතර, මෙම *ගැසට්* නිවේදනයේ ආරම්භයේ ඇති රාජ්‍ය සේවයට පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව හා එයට කලින් කලට කරනු ලබන සංශෝධන, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා රජය මගින් රාජ්‍ය සේවය පිළිබඳව නිකුත් කර ඇති හා කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට ද තෝරා ගනු ලබන්නා යටත් වේ.

4.2 රාජ්‍ය භාෂාව නොවන භාෂා මාධ්‍යයකින් බඳවාගත් නිලධාරියෙකු පත් කළ දින සිට අවුරුදු 03 ක් ඇතුළත රාජ්‍ය භාෂා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. නියමිත කාලය තුළ මෙම පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත් වීම ඊළඟ වැටුප් වර්ධකය විලම්භනය වීමට හේතු වනු ඇත.

4.3 ස්ථිර පත්වීමේ දින සිට වසර 05ක් ඇතුළත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 1/2014 හි දැක්වෙන පරිදි තම තනතුරට අදාළවන මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු වේ. අදාළ කාලය තුළ එම ප්‍රවීණතාව ලබා ගැනීමට අපොහොසත් වුවහොත් එම ප්‍රවීණතාව ලබා ගන්නා තුරු වැටුප් වර්ධක නතර කෙරේ.

4.4 රාජකාරි වේලාවන් සෑම විටම සාමාන්‍ය කාර්යාල වේලාවන් නොවන අතර දිවා රාත්‍රී දෙකෙහිම සහ සෙනසුරාද සහ ඉරිද සහ රජයේ නිවාඩු දිනයන්හි ද යෙදෙනු ඇත. කෘත්‍ය ලේඛන අනුව ද රාජකාරි කිරීමට සිදුවේ.

4.5 තෝරාගනු ලැබූ අයදුම්කරුවන් දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කළ යුතු වේ.

5.0 *සුදුසුකම් :*

5.1 මූලික සුදුසුකම් :

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.

(*ආ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 වන අතර, උපරිම වයස අවුරුදු 30 වේ. (ඒ අනුව 1998.12.14 දිනට හෝ ඊට පෙර හා 1986.12.14 ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

5.2 *අධ්‍යාපන සුදුසුකම් :*

(*අ*) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් (06) කින් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

(*ආ*) විෂයයන් 03කින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත්ව තිබීම.
විෂයය සංයුතිය පහත එක් ආකාරයකට විය යුතු ය.
(1) භෞතික විද්‍යාව, ශුද්ධ ගණිතය සහ ව්‍යවහාරික ගණිතය
(2) භෞතික විද්‍යාව සමග

(i) ශුද්ධ ගණිතය/ව්‍යවහාරික/සංයුක්ත ගණිතය යන විෂයයන්ගෙන් එකක්

සහ

(ii) රසායන විද්‍යාව/ කෘෂි විද්‍යාව/තොරතුරු තාක්ෂණය/පරිගණක විද්‍යාව යන විෂයයන්ගෙන් එකක්.

5.3 ලුහු විදුලි හෝ ලුහු විදුලි හා විදුලි සංදේශ විෂය ක්ෂේත්‍රයට අදළ වෘත්තීය සුදුසුකම් :

(i) රැකියා ක්ෂේත්‍රයට අදළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම
හෝ
(ii) මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව
හෝ
(iii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව
හෝ
(iv) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව
හෝ
(v) විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව
හෝ
(vi) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමුවන කොටස සාර්ථක ලෙස සම්පූර්ණ කර තිබීම.
හෝ
(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

5.4 *කායික සුදුසුකම්* :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය. බඳවා ගැනීමෙන් පසු පවත්වන වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව තහවුරු වුවහොත් තනතුරට නුසුදුසු සේ සලකනු ලැබේ.

***සටහන*** : සියලු සුදුසුකම් අයදුම්පත් බාර ගන්නා දිනයට සම්පූර්ණ කර තිබිය යුතු ය.

6.0 *විභාග පටිපාටිය* :
විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල සහ දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත්වීම සඳහා ලැබිය යුතු අවම ලකුණු ප්‍රතිශත* | *කාලය* |
|---|---|---|---|---|
| I | බුද්ධි පරීක්ෂණය | 100 | 40% | පැය 01 |
| II | විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | 100 | 40% | පැය 02 |

7.0 *විෂය නිර්දේශය* :

(I) බුද්ධි පරීක්ෂණය :
මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ විශ්ලේෂණ තත්වයත්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්තවන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(II) විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය :
භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව විෂයයන්ට අදාළව අ.පො.ස.(උ.පෙළ) විභාග මට්ටම හා ඒ දක්වා වූ යාන්ත්‍රණ විද්‍යාව, ඒකක හා මාන, පදාර්ථයේ ගුණ, කම්පන හා තරංග, තාපය සහ විද්‍යුතය, විද්‍යුත් මූලධර්ම, අර්ධ සන්නායක, ඩිජිටල් තාක්ෂණය, විවිධ සන්නිවේදන සහ දත්ත හුවමාරු ක්‍රම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුම විනිශ්චය කිරීම සඳහා වන ප්‍රශ්නවලින් යුක්තය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

8.0 තේරීම් පරිපාටිය :

8.1 ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ඉහලම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් අතරින්, පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු ගණනට සමාන අයදුම්කරුවන් ගණන, ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. ( සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් සනාථ කළ නොහැකි වන අයදුම්කරුවන් විභාගයේදී නියමිත කුසලතා මට්ටම ලබා සිටියද බඳවා ගනු නොලැබේ.)

8.2 ලිඛිත විභාගයට පෙනී සිට මෙම නිවේදනයේ 6.0 ඡේදයට අනුව සමත් අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දෙනු ඇත. ලිඛිත පරීක්ෂණයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

9.0 අයදුම්පත් සකස් කිරීම :

9.1 අයදුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ය.

9.2 සිංහලෙන් සහ දෙමළෙන් ඉදිරිපත් කරන අයදුම්පත්‍රවල ශීර්ෂයේ සඳහන් විභාගයේ නම් එම භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද සඳහන් කළ යුතුය.

9.3 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සෙ.මී. 21 x 29 (ඒ 4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම් පත්‍රය සකස් කර ගත යුතුය. අංක 01 සිට 07 දක්වා ශීර්ෂ 01 පිටුවේද, අංක 08.0 සිට 11.1 දක්වා ශිර්ෂ 02 පිටුවේද, අංක 12.0 - 16 දක්වා ශීර්ෂ 03 පිටුවේද, අංක 17 ශීර්ෂය 04 පිටුවේද ඇතුලත් වන පරිදි අයදුම්පත්‍රය සැකසිය යුතුය.

10.0 අයදුම්පත් සම්පූර්ණ කිරීම :

10.1 අයදුම්කරු/කාරිය ගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

10.2 පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර නොදෙන හෙයින් නිවැරදිව සම්පූර්ණ කළ යුතුය.

10.3 විභාග ගාස්තුව ගෙවා කුවිතාන්සිය ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයෙහි ඇලවිය යුතුය.

10.4 අයදුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, රු.240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

10.5 සාවද්‍ය තොරතුරු සැපයීම :
මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් හෝ ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයට පසුව හෝ ඔහු/ඇය ගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමටද සේවයට බඳවා ගත් පසුව ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමටද ඉඩ ඇත.

11.0 අයදුම්පත් යොමු කිරීම

11.1 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2016.12.14 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

11.2 අයදුම්පත් යොමු කිරීම :

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503
කොළඹ.

11.3 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මගින්ද නියමිත දිනට හෝ පෙර ඉදිරිපත් කළ යුතුවේ.

11.4 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරී තනතුරට බඳවා ගැනීම - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

11.5 සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි හා මුදල් ගෙවූ ලදුපතෙහි ඡායා පිටපත් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12.0 අයදුම්පත් භාරගැනීම හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම.

12.1 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරුවන් විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

12.2 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත්‍රය සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

12.3 මෙම නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12.4 අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය.ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ පිටපතද , විභාග ගාස්තුවට අදාල ලදුපතෙහි පිටපතද, අයදුම්පත්‍රය තැපැලෙන් යොමු කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සියද අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් විභාග දෙපාර්තමේන්තුවෙන් විමසා සිටීම සුදුසුය.ඔබ කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් ඉහත විස්තර සමඟ ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක්ද සඳහන් ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීමද සුදුසුය.

13.0 විභාග ගාස්තුː

විභාග ගාස්තුව රු.750/- කි.එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003 - 02 -13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් / උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත , එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ.ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

14.0 විභාගයට පෙනී සිටීමː

14.1 මෙම විභාගය 2017 පෙබරවාරි මාසය තුළ කොළඹදී විභාග දෙපාර්තමේන්තුව විසින් සිංහල සහ දෙමළ යන මාධ්‍යවලින් පවත්වනු ලැබේ.

14.2 විභාග අපේක්ෂකයින් විභාගයට පෙනී සිටීමට ප්‍රථම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතුය. විභාග මධ්‍යස්ථානයේදී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර , එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඔබට අවසර නොලැබෙනු ඇත. තවද අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතුය.

14.3 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝණය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට විභාග අපේක්ෂකයා/අපේක්ෂිකාව යටත් විය යුතුය.

15.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :
විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත;

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

16.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් , ඒ සම්බන්ධව කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.සියළුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

17.0 සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ලලිත් චන්ද්‍රපාල,
කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

2016 නොවැම්බර් මස 11 වැනි දින,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

**ආදර්ශ අයදුම්පත්‍රය**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ
ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විදුලි සංදේශ හා රේඩාර් කාර්මික නිලධාරි (III ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

Open Competitive Examination for Recruitment to the Post of Tele Communication and Radar Technical Officers (Grade III) of the Sri Lanka Technological Service - 2016

* විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (කොටුව තුළ අදාළ අංකය යොදන්න) [ ] සිංහල - 2
දෙමළ - 3

01. (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ආ) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම් වල මුලකුරු පසුව යොද නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
උදා : (GUNAWARDHANA, H. M. S. K.)
සම්පූර්ණ නම :
(සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

03. ස්ත්‍රී/පුරුෂභාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1 (කොටුව තුළ අදාළ අංකය යොදන්න)

04. ස්ථිර ලිපිනය :—————.

(අ) (සිංහලෙන්/දෙමළෙන්) :—————.

(ආ) ඉංග්‍රීසියෙන් :

(ඉංග්‍රීසි කැපිටල් අකුරින් පිරවිය යුතුයි.)

(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ඇත.)

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

(ඇ) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :—————.

(ඉ) ඔබගේ දුරකතන අංකය : ස්ථාවර :—————. ජංගම :—————.

05. (අ) උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ආ) 2016.12.14 වැනි දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

06. විවාහක/අවිවාහක බව : විවාහක - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐ අවිවාහක - 2

07. ජනවර්ගය :
සිංහල - 1, ද්‍රවිඩ - 2, වෙනත් - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐

08. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගය :

*පළමුවන වර*
වර්ෂය :—————.
විභාග අංකය :—————.

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

*දෙවන වර*
වර්ෂය :—————.
විභාග අංකය :—————.

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

(ආ) අ. පො. ස. (උ. පෙළ) විභාගය ඃ

වර්ෂය :————. විභාග අංකය :————.

| අනු. අංකය | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

09. වෘත්තීය සුදුසුකම්/තාක්‍ෂණික සුදුසුකම් ඃ
9.1 ලබා ඇති උපාධිය/ඩිප්ලෝමාව :————.

9.2 අදාළ උපාධිය/ඩිප්ලෝමාව පිරිනමනු ලැබූ ආයතනයේ නම :————.

9.3 අදාළ උපාධිය/ඩිප්ලෝමාව වලංගුවන දිනය :————.

10. වෙනත් සුදුසුකම් :————.

11. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා හෝ දැනට ඔබට එරෙහිව සිදු කෙරෙමින් පවතින අධිකරණ ක්‍රියාමාර්ගයක් පවතී ද? ඔව්/නැත
11.1 ඔව් නම් විස්තර සඳහන් කරන්න. :————.

12. අයදුම්කරු දැනට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කරන්නේ නම් තනතුරේ නම, සේවය කරන දෙපාර්තමේන්තුවේ නම සහ ලිපිනය :————.

13. අයදුම්කරු මීට පෙර රජයේ/පළාත් රාජ්‍ය සේවයේ රැකියාවක් කර ඉවත් වී සිටින අයෙක් නම් එසේ ඉවත් වීමට හේතුව :————.

14. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු ඃ
14.1 විභාග ගාස්තු ගෙවූ තැපැල්/උපතැපැල් කාර්යාලය :————.
14.2 රිසිට්පත් අංකය :————.
14.3 මුදල් ගෙවූ දිනය :————.

| |
|---|
| මුදල් ගෙවූ ලදුපත නොගැළවෙන සේ අලවන්න.<br><br>ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න. |

15. අයදුම්කරුගේ සහතිකය ඃ

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලු සුදුසුකම් 2016.12.14 දිනට සම්පූර්ණ කර ඇති බවත් ප්‍රකාශ කර සිටිමි.
(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව දැන සිටිමි.
(ඇ) රු. 750 ක් ගෙවා ලබාගත් ලදුපත අදාළ ස්ථානයේ අලවා ඇත.
(ඈ) තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.
(ඉ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ................................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ..................... දින මා ඉදිරිපිට දී ඉහත 15 ඡේදය යටතේ අත්සන තබන ලද බවත් සහතික කරමි. තව ද ඔහු/ඇය විසින් නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

—————,
සහතික කරන්නාගේ අත්සන.

දිනය :—————.

සහතික කරන්නාගේ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

17. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

17.1 ඉහත තොරතුරු සඳහන් ...........................මහතා/මහත්මිය/මෙනෙවිය ..................කාර්යාලයේ සේවය කරන බව ද ඔහු/ඇය .................. දින සිට .................. තනතුරක සේවය කරන බව ද සහතික කරමි.

17.2 නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර පහ තුළ වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායකය/අසතුටුදායකය.
සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත.
කිසිදු විනය දඬුවමකට ලක්ව නැත/ඇත.
(විනය දඬුවමකට ලක්ව තිබේ නම් තොරතුරු සඳහන් කරන්න) :—————.

17.3 ඉල්ලුම් කරනු ලබන තනතුරට තෝරාගනු ලැබුවහොත් වර්තමාන තනතුරින් මෙම නිලධාරියා මුදා හැරිය හැකිය./ නොහැකිය.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
නිල මුද්‍රාව.

දිනය :—————.

11-504

---

**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය**

කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුර සඳහා
බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2016

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයට අයත් කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුරේ පවතින පුරප්පාඩු 89 ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන අනුව සහ අමාත්‍ය මණ්ඩල තීරණ ලිපි අංක අමප/16/0473/712/005 සහ 2016.07.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සීමිත පදනම මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම්, 2016.12.14 දිනට 02 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. විභාගය කොළඹ නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව තනතුරට බඳවා ගනු ලැබේ.

02. *සුදුසුකම්* :

2.1 අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද:

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥයෙකු වීම සහ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත MN - 1 - 2006 - A හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර පහ (05)කට නො අඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ;

හෝ

(ආ) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත MN - 1 - 2006 - A හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර දහය (10)කට නො අඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සහ තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා සෑම අයුරකින්ම ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

2.3 වෙනත් සුදුසුකම්:

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්න වසර පහ (05) ක කාල සීමාව තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iii) සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්නතම වසර පහ (05) ක කාල සීමාව තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

(iv) පූර්වාසන්න වසර පහ තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනය දඬුවමක් ලබා නොතිබීම.

(v) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

03. *වයස් සීමාව* : අදාළ නොවේ.

04. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය.

(ii) මෙම පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ය.

(iii) පත්වීමේ දින සිට වසර 03ක් ගතවීමට පෙර බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි I වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව තනතුරට පත් වී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවයන් සපුරාලිය යුතු ය.

(v) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සහ ඒවායේ සිදු කෙරෙන සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද 2013.09.26 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීම් පරිපාටියට මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් කම්කරු නිලධාරී තනතුරේ II වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(vi) තෝරා ගනු ලබන අපේක්ෂකයන් දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය.

(vii) තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/ හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට කම්කරු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

05.වැටුප් පරිමාණය ඃ

මෙම තනතුරට රු.34,605 - 10 × 660 - 11 × 755 - 15 × 930 - රු.63,460/- මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි MN - 05 - 2016 වැටුප් කාණ්ඩය- එම චක්‍රලේඛයේ II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ)

06.ලිඛිත විභාගය ඃ

ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. කම්කරු නීති | පැය 03 | 100 | 40 |
| 02. සිද්ධි අධ්‍යයනය | පැය 03 | 100 | 40 |

විභාගය පවත්වනු ලබන්නේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පමණි. ඉල්ලුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ රාජ්‍ය සේවයට ඇතුළත් වීම පිණිස වූ සුදුසුකම් ලබා ගැනීමේ/ සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවකින්ම විය යුතුය. එමෙන්ම අපේක්ෂකයෙකු විභාගයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු අතර, එක් එක් ප්‍රශ්න පත්‍රයට 40%ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ගන්නා වූ අපේක්ෂකයන් පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව, පුරප්පාඩු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය කම්කරු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

අපේක්ෂකයන් එක් අයෙකුට වැඩි ගණනක් එකම මුළු ලකුණු සංඛ්‍යාව ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් අනුව කම්කරු කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

07. ලිඛිත විභාගය පහත විෂය නිර්දේශය යටතේ පවත්වනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. කම්කරු නීති | පහත සඳහන් කම්කරු අණපනත් අළලා ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.<br>(i) 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥාපනත<br>(ii) 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත<br>(iii) 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත<br>(iv) 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත<br>(v) 1971 අංක 45 දරන සේවකයින්ගේ සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත<br>(vi) 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත<br>(vii) 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥාපනත |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| | (viii) 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත |
| | (ix) 1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥාපනත |
| | (x) 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත |
| 02. සිද්ධි අධ්‍යයනය | අපේක්ෂකයාගේ නිර්මාණාත්මක චින්තන ශක්තිය සහ ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. මේ සඳහා අපේක්ෂකයා විසින් විසඳුම් ලබාදෙනු පිණිස ප්‍රස්ථාවන් එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද ගැටලු යොමු කරනු ඇත. |

08.සම්මුඛ පරීක්ෂණය :

සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

*සැලකිය යුතුයි :*

සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සළකනු නොලැබේ.

09. විභාග ගාස්තුව :

විභාග ගාස්තුව රු. 1,200/- කි. එය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර මෙම ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ.ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10. අයදුම් කිරීමේ ක්‍රමය :

(අ) අයදුම්පත්, අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය ඒ 4 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින්, අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 8.2 තෙක් පළමුවන පිටුවටද, 09 සිට 13.10 තෙක් දෙවන පිටුවටද, 13.11 සිට 15 තෙක් තුන්වන පිටුවටද ඉතිරිය 4 වන පිටුවටද වන පරිද්දෙන් තම අයදුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත්ද භාවිතා කළ හැකිය. අයදුම් පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතු අතර ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන අයදුම් පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම් පත්‍රය මෙම විභාග නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසිලිමත් විය යුතුය. එසේ නොවුනහොත් අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප විය හැකිය.

(ආ) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂාවෙන්ම අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුය. අයදුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම් පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම් පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන්ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(ඇ) විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

(ඈ) අයදුම්කරු දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන නිලධාරියෙකු ලවා තම අත්සන සහතික කරවා ගත යුතුය.

(ඉ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2016.12.14 දිනට පෙර යැවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි තනතුර - II සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2016" යනුවෙන් ලිවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503, කොළඹ.

(ඊ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

11. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් එම නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වනු ඇත. තව ද, එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදළ ලදුපතේ පිටපත හා අයදුම් පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදනමින් තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. විභාගයට පෙනී සිටීම :

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති සියලුම අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත්කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම විභාගය පවත්වන දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය.

(ඇ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ඈ) විභාග ප්‍රතිඵල -
ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයෙන් ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ඇත.

*සටහන* : අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත්කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවන බව සැළකිය යුතුය.

13.අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :
තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පුකර තිබිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත්කරන ලද ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් ඃ

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත්කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත්කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත්කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහකිරීමට ඉඩ ඇත.

15.කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද, මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද කම්කරු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

16.මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කම්කරු කොමසාරිස් ජනරාල්,

කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහ ලේකම් කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ - 05.

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුර සඳහා**
**බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2016**

Limited Competitive Examination for Recruitment to the Post of Labour Officer - II in the Department of Labour - 2016

01. මාධ්‍යය -
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය ඃ
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

02. පෞද්ගලික තොරතුරු -
2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ (SILVA A.B.D.P.A)

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————.

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :——————.

03. 3.1 කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :————.

3.2 කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :——————.

3.3 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :——————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය ඃ (පුරුෂ - 0, ස්ත්‍රී - 1)
අදාළ අංකය කොටුව තුළ ලියන්න

05. ජාතික හැඳුනුම්පත් අංකය ඃ

06. විවාහක/අවිවාහක බව : (අවිවාහක - 1, විවාහක - 2)
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

07. ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියන් දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
අදාළ අංකය කොටුව තුළ ලියන්න.

08. 8.1 උපන් දිනය: වර්ෂය : මාසය : දිනය :

8.2 2016.12.14 දිනට වයස : අවුරුදු : මාස : දින :

09. දුරකථන අංකය :

10. ඔබ 2016.12.14 දිනට සේවයේ යෙදී සිටින තනතුරට/සේවයට/ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාව සඳහන් කරන්න. :————.

11. 2016.12.14 දිනට ගැසට් නිවේදනයේ 02 වන ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබේද ? :————.

12. අධ්‍යාපන සුදුසුකම් :
12.1 උපාධිය :————.
12.2 විශ්ව විද්‍යාලය/ආයතනය :————.
12.3 සාමාර්ථය (පන්ති සාමාර්ථයක් ඇත්නම් සඳහන් කරන්න) :————.
12.4 උපාධිය වලංගු දිනය :————.
12.5 විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.
12.6 නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් දිනය :————.
අදාළ නම් පමණක් සඳහන් කරන්න)

13. පළපුරුද්ද :
13.1 විභාග අපේක්ෂකත්වය සඳහා සුදුසුකම් ලබාදෙන සේවා/ශ්‍රේණි (පන්තියක්, ශ්‍රේණියක් හෝ ඛණ්ඩයක් ඇත්නම්) සඳහන් කරන්න :————.
13.2 දැනට දරන තනතුර :————.
13.3 එම තනතුර අයත් වන්නේ රාජ්‍ය සේවයට ද පළාත් රාජ්‍ය සේවයට ද යන්න :————.
13.4 ශ්‍රේණිය :————.
13.5 පන්තිය/ඛණ්ඩය :————.
13.6 තනතුරට පත් වූ දිනය :————.
13.7 එම තනතුරේ ස්ථිර කළ දිනය :————.
13.8 වැටුප් කේත අංකය :————.
13.9 වැටුප් පරිමාණය :————.

13.10 අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සේවා කාලයන් කිහිපයක් අදාළ නම් එම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයන් පිළිබඳ විස්තර පහත වගුවේ සඳහන් කරන්න :

| *සේවයේ/ශ්‍රේණියේ නම* | *අදාළ රා.පරි. චක්‍රලේඛ පරිදි වැටුප් කේත අංකය (උදා. : MN - 1 - 2006 A)* | *පත් වූ දිනය* | *ස්ථිර කළ දිනය* |
|---|---|---|---|
| (1) ………………… | ………………… | ………………… | ………………… |
| (2) ………………… | ………………… | ………………… | ………………… |
| (3) ………………… | ………………… | ………………… | ………………… |
| (4) ..………………… | ………………… | ………………… | ………………… |

13.11 ගැසට් නිවේදනයේ 02 වන ඡේදයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව අනුමත තනතුරක සුදුසුකම් සම්පූර්ණ කළ යුතු 2016.12.14 දිනට සක්‍රීය හා සතුටුදායක මුළු සේවා කාලය :————.

14. විභාග ගාස්තු ගෙවීම :

14.1 ගෙවූ මුදල :————.

14.2 ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය :————.

14.3 ගෙවූ දිනය :————.

14.4 ලදුපත් අංකය :————.

| ලදුපත එහි දරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ ඡායා පිටපත් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |
|---|

15. අයදුම්කරුගේ සහතිකය :

2016.12.14 දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, *ගැසට්* නිවේදනයේ 2.1 ඡේදයට අනුව 2016.12.14 දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මම භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි.

*ගැසට්* නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සෙකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .................................. හා .................................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පරිපාටිය අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (*ගැසට්* නිවේදනයේ 10 (ඇ) ඡේදය පරිදි විය යුතුය.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................................................................ (අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්,........................... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තබන ලද බවත් මම සහතික කරමි.

————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සහතික කළ යුතුයි.)

17. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ......................................................................................... මයා./මිය./මෙනවිය මධ්‍යම රජය යටතේ වන/පළාත් සභාව යටතේ වන ........................................................ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ .............................. ........... තනතුරක සේවය කරන බවද, 2016.12.14 දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ල උපයාගෙන ඇති බවද, එම කාල සීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බවද, *ගැසට්* නිවේදනයේ 2.1 වන ඡේදයට අනුව අවුරුදු ............................ (පහක/දහයක) සක්‍රීය හා සතුටුදායක සේවා

කාලයක් සහිත බව ද, අදාළ ගැසට් නිවේදනයේ සදහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, ඔහු/ඇය මා ඉදිරිපිටදී මෙම අයදුම් පත්‍රය අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

————,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/බලයලත්
නිලධාරියාගේ අත්සන)

දිනය :————.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.
(නිල මුද්‍රාවකින් සහතික කළ යුතුය)

11-857/1

---

**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය**

කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුර සඳහා
බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයට අයත් කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුරේ පවතින පුරප්පාඩු 89 ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන අනුව සහ අමාත්‍ය මණ්ඩල තීරණ ලිපි අංක අමප/16/0473/712/005 සහ 2016.07.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම්, 2016.12.14 දිනට 02 වන හා 03 වන ඡේදයන්හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. විභාගය කොළඹ නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවලදී පමණක් පැවැත්වේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව තනතුරට බඳවා ගනු ලැබේ.

02. *සුදුසුකම් :*

2.1 *අධ්‍යාපන සුදුසුකම් :*

(*අ*) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

*හෝ*

(*ආ*) ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥයෙකු වීම.

2.2 *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සහ තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා සෑම අයුරකින්ම ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතුය.

2.3 *වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *වයස් සීමාව :*

අයදුම්කරුවන්, අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 1995.12.14 දිනට හෝ ඊට පෙර හා 1981.12.14 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය.

(iii) පත්වීමේ දින සිට වසර 03ක් ගතවීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව ලබා ගත යුතු අතර රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

(v) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට සහ ඒවායේ සිදු කෙරෙන සංශෝධන වලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලටද 2013.09.26 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලටද එම බඳවා ගැනීම් පරිපාටියට මින් මතු කෙරෙන සංශෝධන වලටද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් කම්කරු නිලධාරි තනතුරේ II වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(vi) තෝරා ගනු ලබන අපේක්ෂකයන් දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතුය.

(vii) තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට කම්කරු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

05. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රු.34605 - 10 × 660 - 11 × 755 - 15 × 930 - රු. 63,460/- මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි MN - 05 - 2016 වැටුප් කාණ්ඩය-එම චක්‍රලේඛයේ II උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.)

06. ලිඛිත විභාගය :

ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. රචනය හා සාරාංශය | පැය 03 | 100 | 40 |
| 02. අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

විභාගය පවත්වනු ලබන්නේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පමණි. ඉල්ලුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු අතර, එක් එක් ප්‍රශ්න පත්‍රයට 40%ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ගන්නා වූ අපේක්ෂකයන් පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව, පුරප්පාඩු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය කම්කරු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

අපේක්ෂකයන් එක් අයෙකුට වැඩි ගණනක් එකම මුළු ලකුණු සංඛ්‍යාව ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් අනුව කම්කරු කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

07. ලිඛිත විභාගය පහත විෂය නිර්දේශය යටතේ පවත්වනු ලැබේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. රචනය හා සාරාංශය | දේශීය හා විදේශීය වශයෙන් වැදගත් දේශපාලන, ආර්ථික හා සමාජයීය වෙනස්කම් පිළිබඳ කාලීන තොරතුරු ආශ්‍රයෙන් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ. |
| 02. අභියෝග්‍යතා පරීක්ෂණය | අපේක්ෂකයාගේ භාෂාමය හා සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය හා තීරණ ගැනීමේ හැකියාවන් පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. |

*08. සම්මුඛ පරීක්ෂණය :*

සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

*සැලකිය යුතුයි :*

සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සළකනු නොලැබේ.

*09. විභාග ගාස්තුව :*

විභාග ගාස්තුව රු. 1,200/- කි. එය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මඟින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර මෙම ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ.ලදුපතෙහි ඡායා පිටපතක් ලඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*10. අයදුම් කිරීමේ ක්‍රමය :*

(*අ*) අයදුම්පත්, අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය ඒ 4 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින්, අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 8.2 තෙක් පළමුවන පිටුවට ද, 09 සිට 14 තෙක් දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද, වන පරිද්දෙන් තම අයදුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය. අයදුම් පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතු අතර ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම විභාග නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසිලිමත් විය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප විය හැකිය.

(*ආ*) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂාවෙන්ම අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(*ඇ*) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු. 2,40,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

(*ඈ*) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2016.12.14 දිනට පෙර යැවිය යුතු ය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි තනතුර - II සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016" යනුවෙන් ලිවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,<br>
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,<br>
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>
තැ. පෙ. 1503, කොළඹ

(*ඉ*) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

(*ඊ*) අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ

විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේ දී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මගින් විභාග ප්‍රවේශපත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් එම නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වනු ඇත. තව ද, එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සුදනමින් තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*11. විභාගයට පෙනී සිටීම :*

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති සියලුම අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම විභාගය පවත්වන දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතු ය.

(ඇ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ඉ) *විභාග ප්‍රතිඵල :*
ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයෙන් ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබා දෙනු ඇත.විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ඇත.

***සටහන*** .- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවන බව සැළකිය යුතු ය.

*12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්න්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර තිබිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*13. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :*

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

14. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද, මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද කම්කරු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කම්කරු කොමසාරිස් ජනරාල්,
කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහ ලේකම් කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ - 05.

**ආදර්ශ අයදුම්පත්‍රය**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුර සඳහා**
**බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016**

Open Competitive Examination for Recruitment to the Post of Labour Officer - II in the Department of Labour - 2016

01. මාධ්‍යය -
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙනි.

02. පෞද්ගලික තොරතුරු -
2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදාහරණ* (SILVA A.B.D.P.A)
2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.
2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

03. 3.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :—————.
3.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :—————.
3.3 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - 0, ස්ත්‍රී - 1)
අදාළ අංකය කොටුව තුළ ලියන්න

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. විවාහක/අවිවාහක බව : (අවිවාහක - 1, විවාහක - 2)
අදාළ අංකය කොටුව තුළ ලියන්න

07. ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියන් දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
අදාළ අංකය කොටුව තුළ ලියන්න

08. 8.1 උපන් දිනය: වර්ෂය මාසය දිනය

8.2 2016.12.14 දිනට වයස : අවුරුදු මාස දින

09. දුරකථන අංකය :

10. අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :
10.1 උපාධිය :—————.
10.2 විශ්වවිද්‍යාලය/ආයතනය :—————.
10.3 සාමාර්ථය (පන්ති සාමාර්ථයක් ඇත්නම් සඳහන් කරන්න) :—————.
10.4 උපාධිය වලංගු දිනය :—————.
10.5 විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :—————.
10.6 නීතිඥයකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් දිනය :—————.
(අදාළ නම් පමණක් සඳහන් කරන්න)

11. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද ?
එසේ නම් ඒ පිළිබඳව විස්තර :—————.

12. ඔබ මීට පෙර රජයේ සේවයේ යෙදී සිටිය දී සේවය අවසන් කර තිබේ ද?
එසේ නම් එම විස්තර සහ සේවය අවසන් කිරීමට හේතු :—————.

13. විභාග ගාස්තු ගෙවීම :
13.1 ගෙවූ මුදල :—————.
13.2 ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය :—————.
13.3 ගෙවූ දිනය :—————.
13.4 ලදුපත් අංකය :—————.

| |
|---|
| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |

14. අයදුම්කරුගේ සහතිකය :

*ගැසට්* නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව විවෘත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සෙකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක .................................... හා ..................................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීති රීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පරිපාටිය අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන

දිනය :—————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (*ගැසට් නිවේදනයේ* 10 ඡේදයේ (ඇ) පරිදි විය යුතු ය.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ...................................................................................................... (අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්,........................... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තබන ලද බවත් මම සහතික කරමි.

—————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :—————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවකින් සහතික කළ යුතු ය.)

16. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ...................................................................................................... මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................................... ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකි ය.

—————,
(ආයතන ප්‍රධානියාගේ අත්සන)

දිනය :—————.
නම :—————.
තනතුර :—————.
(නිල මුද්‍රාවකින් සහතික කළ යුතු ය)

11-857/2

**කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය**

කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරී - II තනතුර සඳහා බඳවා ගැනීම

**උතුරු සහ නැගෙනහිර පළාත්වල දෙමළ මාධ්‍ය පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විශේෂ විවෘත තරග විභාගය - 2016**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයට අයත් කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරී - II තනතුරේ උතුරු සහ නැගෙනහිර පළාත්වල දෙමළ මාධ්‍ය නිලධාරීන් සඳහා පවතින පුරප්පාඩු 12 ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන අනුව සහ අමාත්‍ය මණ්ඩල තීරණ ලිපි අංක අමප/16/0473/712/005 සහ 2016.07.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විවෘත පදනම මත විශේෂ තරග විභාගයකින් බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම්, 2016.12.14 දිනට 02 වන හා 03 වන ඡේදයන්හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. විභාගය කොළඹ නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව තනතුරට බඳවා ගනු ලැබේ.

02. *සුදුසුකම්* :

2.1 අධ්‍යාපන සුදුසුකම්:

(*අ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

*හෝ*

(*ආ*) ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥයෙකු වීම.

2.2 කායික සුදුසුකම්:

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සහ තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා සෑම අයුරකින්ම ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

2.3 වෙනත් සුදුසුකම්:

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(ii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. *වයස් සීමාව* :

අයදුම්කරුවන්, අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 1995.12.14 දිනට හෝ ඊට පෙර හා 1981.12.14 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය.

(iii) පත්වීමේ දින සිට වසර 03ක් ගතවීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවාවට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව ලබා ගත යුතු අතර රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතු ය.

(v) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සහ ඒවායේ සිදු කෙරෙන සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද 2013.09.26 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත

කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීම් පරිපාටියට මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් කම්කරු නිලධාරි තනතුරේ II වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(vi) තෝරා ගනු ලබන අපේක්ෂකයන් බඳවා ගත් දින සිට උතුරු හෝ නැගෙනහිර පළාත්වල වසර 8 ක අනිවාර්ය සේවා කාලයකට යටත් වේ.

(vii) තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට කම්කරු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

05. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට රු.34,605 - 10 × 660 - 11 × 755 - 15 × 930 - රු.63,460/- මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි MN - 05 - 2016 වැටුප් කාණ්ඩය-එම චක්‍රලේඛයේ II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ)

06. *ලිඛිත විභාගය :*

ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. රචනය හා සාරාංශය | පැය 03 | 100 | 40 |
| 02. අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

විභාගය පවත්වනු ලබන්නේ දෙමළ මාධ්‍යයෙන් පමණි.

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු අතර, එක් එක් ප්‍රශ්න පත්‍රයට 40%ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ගන්නා වූ අපේක්ෂකයන් පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව, පුරප්පාඩු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය කම්කරු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

අපේක්ෂකයන් එක් අයෙකුට වැඩි ගණනක් එකම මුළු ලකුණු සංඛ්‍යාව ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් අනුව කම්කරු කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

07. *ලිඛිත විභාගය පහත විෂය නිර්දේශය යටතේ පවත්වනු ලැබේ.*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. රචනය හා සාරාංශය | දේශීය හා විදේශීය වශයෙන් වැදගත් දේශපාලන, ආර්ථික හා සමාජයීය වෙනස්කම් පිළිබඳ කාලීන තොරතුරු ආශ්‍රයෙන් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කෙරේ. |
| 02. අභියෝග්‍යතා පරීක්ෂණය | අපේක්ෂකයාගේ භාෂාමය හා සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය හා තීරණ ගැනීමේ හැකියාවන් පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. |

08. *සම්මුඛ පරීක්ෂණය :*

සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

**සැළකිය යුතුයි :**

සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සළකනු නොලැබේ.

09. විභාග ගාස්තුව :

විභාග ගාස්තුව රු. 1,200/- කි. එය අයදුම්පත්භාර ගන්නා අවසාන දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මඟින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර මෙම ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ.ලදුපතෙහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10. අයදුම් කිරීමේ ක්‍රමය :

(අ) අයදුම්පත්, අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය ඒ 4 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින්, අයදුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 8.2 තෙක් පළමුවන පිටුවට ද, 09 සිට 14 තෙක් දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන පරිද්දෙන් තම අයදුම් පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය. අයදුම් පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතු අතර, ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන අයදුම් පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම් පත්‍රය මෙම විභාග නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසිලිමත් විය යුතුය. එසේ නොවුනහොත් අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප විය හැකිය.

(ආ) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂාවෙන්ම අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය. අයදුම් පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(ඇ) අයදුම්පත්‍රයේද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය.කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥ වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු, රු 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(ඈ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2016.12.14 වැනි දිනට පෙර යැවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "කම්කරු දෙපාර්තමේන්තුවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල කම්කරු නිලධාරී තනතුර - II සඳහා බඳවා ගැනීමේ විශේෂ විවෘත තරග විභාගය - 2016" යනුවෙන් ලිවිය යුතුය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503, කොළඹ.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

(ඊ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සහිත

ඉල්ලීම් ලිපියක් එම නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වනු ඇත. තව ද, එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදාල ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සුදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

11. විභාගයට පෙනී සිටීම :

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති සියලුම අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම විභාගය පවත්වන දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය.

(ඇ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ඉ) විභාග ප්‍රතිඵල -

ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයෙන් ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබා දෙනු ඇත.විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ඇත.

*සටහන* : අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවන බව සැළකිය යුතුය.

12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්න්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය ඔප්පු කර තිබිය යුතුය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

13. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑ කමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

14. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද, මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව තීරණ ගැනීමටද කම්කරු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

15. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කම්කරු කොමසාරිස් ජනරාල්.

කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහ ලේකම් කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ - 05.

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරී - II තනතුර සඳහා බඳවා ගැනීම**
**උතුරු සහ නැගෙනහිර පළාත්වල දෙමළ මාධ්‍ය පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විශේෂ විවෘත තරග විභාගය - 2016**
**Special Open Competitive Examination in Tamil medium for Recruitment to the Post of Labour Officer - II in the Department of Labour for the Vacancies Existing in Northern and Eastern Provinces - 2016**

01. මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
03 - දෙමළ
(අදාළ අංකය කොටුව තුළ යොදන්න.)
අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි

02. පෞද්ගලික තොරතුරු :
2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ (SILVA A.N.S.P.T)
2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.3 සම්පූර්ණ නම (දෙමළෙන්) :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :

04. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - 0, ස්ත්‍රී - 1)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. 5.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :————.
5.2 ස්ථිර ලිපිනය (දෙමළෙන්) :————.
5.3 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

06. විවාහක/අවිවාහක බව : (අවිවාහක - 1, විවාහක - 2)
අදාළ අංකය කොටුව තුළ ලියන්න

07. ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියන් දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
අදාළ අංකය කොටුව තුළ ලියන්න

08. 8.1 උපන් දිනය: වර්ෂය මාසය දිනය

8.2 2016.12.14 දිනට වයස : අවුරුදු මාස දින

09. දුරකථන අංකය :

10. අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :
10.1 උපාධිය :————.
10.2 විශ්වවිද්‍යාලය/ආයතනය :————.
10.3 සාමාර්ථය (පන්ති සාමාර්ථයක් ඇත්නම් සඳහන් කරන්න) :————.
10.4 උපාධිය වලංගු දිනය :————.
10.5 විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.
10.6 නීතිඥයෙකු ලෙස ශේෂ්‍යාධිකරණයේ දිවුරුම් දුන් දිනය :————.
(අදාළ නම් පමණක් සඳහන් කරන්න)

11. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියකදී වැරදිකරු වී ඇත් ද ?
එසේ නම් ඒ පිළිබඳව විස්තර :————.

12. ඔබ මීට පෙර රජයේ සේවයේ යෙදී සිටියදී සේවය අවසන් කර තිබේ ද?
එසේ නම් එම විස්තර සහ සේවය අවසන් කිරීමට හේතු :————.

13. විභාග ගාස්තු ගෙවීම :
 13.1 ගෙවූ මුදල :————.
 13.2 ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය :————.
 13.3 ගෙවූ දිනය :————.
 13.4 ලදුපත් අංකය :————.

| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |
|---|

14. අයදුම්කරුගේ සහතිකය :

*ගැසට්* නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව විශේෂ විවෘත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සෙකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ..................... හා ..................................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීති රීති වලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පරිපාටිය අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාග යට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (*ගැසට්* නිවේදනයේ 10 ඡේදයේ (ඇ) පරිදි විය යුතුය.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ...................................................................................................... (අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්,........................... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තබන ලද බවත් මම සහතික කරමි.

————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සහතික කළ යුතුයි.)

16. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ...................................................................................................... මයා./මිය./මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................................................ ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

————,
(ආයතන ප්‍රධානියාගේ අත්සන)

දිනය :————.
නම :————.
තනතුර :————.
(නිල මුද්‍රාවකින් සහතික කළ යුතුය)

11-857/3

## කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය

### කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුර සඳහා බඳවා ගැනීම

**උතුරු සහ නැගෙනහිර පළාත්වල දෙමළ මාධ්‍ය පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විශේෂ සීමිත තරග විභාගය - 2016**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයට අයත් කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුරේ උතුරු සහ නැගෙනහිර පළාත්වල දෙමළ මාධ්‍ය නිලධාරීන් සඳහා පවතින පුරප්පාඩු 12 ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන අනුව සහ අමාත්‍ය මණ්ඩල තීරණ ලිපි අංක අමප/16/0473/712/005 සහ 2016.07.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සීමිත පදනම මත විශේෂ තරග විභාගයකින් බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම්, 2016.12.14 දිනට 02 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. විභාගය කොළඹ නගරයේ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව තනතුරට බඳවා ගනු ලැබේ.

02. *සුදුසුකම්* :

2.1 අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සුදුසුකම්/පළපුරුද්ද:

(*අ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥයෙකු වීම සහ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත MN - 1 - 2006 - A හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර පහකට (05) නො අඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

(*ආ*) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත MN - 1 - 2006 - A හෝ ඊට ඉහළ වැටුප් පරිමාණයක් හිමි තනතුරක වසර දහයකට (10) නො අඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2.2 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සහ තනතුරේ රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා සෑම අයුරකින්ම ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය විය යුතු ය.

2.3 වෙනත් සුදුසුකම්:

(i) පත්වීම ස්ථිර කර තිබීම.
(ii) සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්න වසර පහක (05) කාල සීමාව තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(iii) සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්නතම වසර පහක (05) කාල සීමාව තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
(iv) පූර්වාසන්න වසර පහ තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනය දඬුවමක් ලබා නොතිබීම.
(v) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

03. *වයස් සීමාව* : අදාළ නොවේ.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර ය.

(ii) මෙම පත්වීම එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් ය.

(iii) පත්වීමේ දින සිට වසර 03ක් ගතවීමට පෙර බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් පරිදි I වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව තනතුරට පත්වී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවයන් සපුරාලිය යුතුය.

(v) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සහ ඒවායේ සිදු කෙරෙන සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද 2013.09.26 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීම් පරිපාටියට මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් කම්කරු නිලධාරී තනතුරේ II වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(vi) තෝරා ගනු ලබන අපේක්ෂකයන් බඳවා ගත් දින සිට උතුරු හෝ නැගෙනහිර පළාත්වල වසර 8 ක අනිවාර්ය සේවා කාලයකට යටත් වේ.

(vii) තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරී නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මග හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට කම්කරු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

05. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රු.34,605 - 10 × 660 - 11 × 755 - 15 × 930 - රු. 63,460/- මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016හි MN - 05 - 2016 වැටුප් කාණ්ඩය - එම චක්‍රලේඛයේ II වන උපලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ)

06. ලිඛිත විභාගය :

ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. කම්කරු නීති | පැය 03 | 100 | 40 |
| 02. සිද්ධි අධ්‍යයනය | පැය 03 | 100 | 40 |

විභාගය පවත්වනු ලබන්නේ දෙමළ මාධ්‍යයෙන් පමණි.

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු අතර, එක් එක් ප්‍රශ්න පත්‍රයට 40%ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ගන්නා වූ අපේක්ෂකයන් පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව, පුරප්පාඩු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය කම්කරු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

අපේක්ෂකයන් එක් අයෙකුට වැඩි ගණනක් එකම මුළු ලකුණු සංඛ්‍යාව ලබා ඇත්නම්, එවැනි අවස්ථාවක සුදුසු තීරණයක් ගැනීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් අනුව කම්කරු කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලබන අතර, එය අවසාන තීරණය වනු ඇත.

07. ලිඛිත විභාගය පහත විෂය නිර්දේශය යටතේ පවත්වනු ලැබේ.

| ප්‍රශ්නපත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. කම්කරු නීති | පහත සඳහන් කම්කරු අණපනත් අළලා ප්‍රශ්නපත්‍රය සකස් කරනු ඇත.<br>i. 1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥාපනත<br>ii. 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත<br>iii. 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත<br>iv. 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත<br>v. 1971 අංක 45 දරන සේවකයින්ගේ සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත<br>vi. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත<br>vii. 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥාපනත<br>viii. 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත<br>ix. 1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥාපනත<br>x. 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත |
| 02. සිද්ධි අධ්‍යයනය | අපේක්ෂකයාගේ නිර්මාණාත්මක චින්තන ශක්තිය සහ ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. මේ සඳහා අපේක්ෂකයා විසින් විසඳුම් ලබාදෙනු පිණිස ප්‍රස්ථාවන් එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද ගැටලු යොමු කරනු ඇත. |

*08. සම්මුඛ පරීක්ෂණය :*

සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

***සැලකිය යුතුයි*** :

සම්මුඛ පරීක්ෂණයට සහභාගිවීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සළකනු නොලැබේ.

*09. විභාග ගාස්තුව :*

විභාග ගාස්තුව රු. 1,200/- කි. එය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත, එහි එක් දාරයක් මඟින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර මෙම ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ.ලදුපතෙහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*10. අයදුම් කිරීමේ ක්‍රමය :*

(*අ*) අයදුම්පත්, අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය ඒ 4 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින්, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 8.2 තෙක් පළමුවන පිටුවට ද, 09 සිට 13.10 තෙක් දෙවන පිටුවට ද, 13.11 සිට 15 තෙක් තුන්වන පිටුවට ද ඉතිරිය 4 වන පිටුවට ද වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය. අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතු අතර ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම් පත්‍රය මෙම විභාග නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසිලිමත් විය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප විය හැකිය.

(ආ) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂාවෙන්ම අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු ය. අයදුම් පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(ඇ) විභාගය ඉල්ලුම් කරන අවස්ථාවවන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළවන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

(ඈ) අයදුම්කරු දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන නිලධාරියකු ලවා තම අත්සන සහතික කරවා ගත යුතු ය.

(ඉ) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2016.12.14 දිනට පෙර යැවිය යුතු ය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, ''කම්කරු දෙපාර්තමේන්තුවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල කම්කරු නිලධාරි තනතුර - II සඳහා බඳවා ගැනීමේ විශේෂ සීමිත තරග විභාගය - 2016" යනුවෙන් ලිවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාර ගනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503, කොළඹ.

(ඊ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

11. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේදී අයදුම් කළ විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශපත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීම් ලිපියක් එම නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වනු ඇත. තව ද, එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. *විභාගයට පෙනී සිටීම :*

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති සියලුම අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම විභාගය පවත්වන දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතු ය.

(ඇ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ඈ) විභාග ප්‍රතිඵල -
ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයයෙන් ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගන්නා අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළකරනු ඇත.

*සටහන* .— අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් නොවන බව සැළකිය යුතු ය.

13. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර තිබිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත්කරන ලද ජාතික හැඳුනුම්පත,
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :*

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

15. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද, මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද කම්කරු කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

16. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කම්කරු කොමසාරිස් ජනරාල්,
කම්කරු දෙපාර්තමේන්තුව,
කම්කරු මහ ලේකම් කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ - 05.

**ආදර්ශ අයදුම් පත්‍රය**

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

***කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරි - II තනතුර සඳහා බඳවා ගැනීම උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ මාධ්‍ය පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ විශේෂ සීමිත තරග විභාගය - 2016***

Special Limited Competitive Examination in Tamil Medium for Recruitment to the Post of Labour Officer - II in the Department of Labour for the Vacancies Existing in Northern and Eastern Provinces - 2016

01. මාධ්‍යය -
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ යොදන්න.)
අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙනි.

02. පෞද්ගලික තොරතුරු -
2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :——————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ (SILVA A.B.N.P.R)
2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :——————.
2.3 සම්පූර්ණ නම (දෙමළෙන්) :——————.

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - 0, ස්ත්‍රී - 1)
අදාළ අංකය කොටුව තුළ ලියන්න ☐

05. 5.1 කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :————.
5.2 කාර්යාලයීය ලිපිනය (දෙමළෙන්) :————.
5.3 පෞද්ගලික ලිපිනය (දෙමළෙන්) :————.

06. විවාහක/අවිවාහක බව : (අවිවාහක - 1, විවාහක - 2)
අදාළ අංකය කොටුව තුළ ලියන්න ☐

07. ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියන් දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
අදාළ අංකය කොටුව තුළ ලියන්න ☐

08. 8.1 උපන් දිනය: වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

8.2 2016.12.14 දිනට වයස : අවුරුදු | | | මාස | | | දින | | |

09. දුරකථන අංකය : | | | | | | | | | | |

10. ඔබ 2016.12.14 දිනට සේවයේ යෙදී සිටින තනතුරට/සේවයට/ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/ සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාව සඳහන් කරන්න. :————.

11. 2016.12.14 දිනට *ගැසට්* නිවේදනයේ 02 වන ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබේද ? :————.

12. *අධ්‍යාපන සුදුසුකම්* :
12.1 උපාධිය :————.
12.2 විශ්ව විද්‍යාලය/ආයතනය :————.
12.3 සාමාර්ථය (පන්ති සාමාර්ථයක් ඇත්නම් සඳහන් කරන්න) :————.
12.4 උපාධිය වලංගු දිනය :————.
12.5 විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.
12.6 නීතිඥයෙකු ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් දිනය :————.
(අදාළ නම් පමණක් සඳහන් කරන්න)

13. පළපුරුද්ද :
13.1 විභාග අපේක්ෂකත්වය සඳහා සුදුසුකම් ලබාදෙන සේවා/ශ්‍රේණි (පන්තියක්, ශ්‍රේණියක් හෝ ඛණ්ඩයක් ඇත්නම්) සඳහන් කරන්න. :————.
13.2 දැනට දරණ තනතුර :————.
13.3 එම තනතුර අයත් වන්නේ රාජ්‍ය සේවයට ද පළාත් රාජ්‍ය සේවයට ද යන්න. :————.
13.4 ශ්‍රේණිය :————.
13.5 පන්තිය/ඛණ්ඩය :————.
13.6 තනතුරට පත් වූ දිනය :————.
13.7 එම තනතුරේ ස්ථිර කළ දිනය :————.
13.8 වැටුප් කේත අංකය :————.
13.9 වැටුප් පරිමාණය :————.
13.10 අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සේවා කාලයන් කිහිපයක් අදාළ නම් එම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයන් පිළිබඳ විස්තර පහත වගුවේ සඳහන් කරන්න.

| සේවයේ/ශ්‍රේණියේ නම | අදාළ රා.පරි. චක්‍රලේඛ පරිදි වැටුප් කේත අංකය (උදා : MN - 1 - 2006 A) | පත් වූ දිනය | ස්ථිර කළ දිනය |
|---|---|---|---|
| (1) ………………… | ………………… | ………………… | ………………… |
| (2) ………………… | ………………… | ………………… | ………………… |
| (3) ………………… | ………………… | ………………… | ………………… |
| (4) ..………………… | ………………… | ………………… | ………………… |

13.11 *ගැසට් නිවේදනයේ* 02 වන ඡේදයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව, අනුමත තනතුරක සුදුසුකම් සම්පූර්ණ කළ යුතු 2016.12.14 දිනට සක්‍රීය හා සතුටුදායක මුළු සේවා කාලය :—————.

14. විභාග ගාස්තු ගෙවීම :
 14.1 ගෙවූ මුදල :—————.
 14.2 ගෙවන ලද තැපැල්/උප තැපැල් කාර්යාලය :—————.
 14.3 ගෙවූ දිනය :—————.
 14.4 ලදුපත් අංකය :—————.

ලදුපත එහි දරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

15. අයදුම්කරුගේ සහතිකය :

2016.12.14 දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, *ගැසට් නිවේදනයේ* 2.1 ඡේදයට අනුව 2016.12.14 දිනට සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මම භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි.

*ගැසට් නිවේදනයේ* සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව, විශේෂ සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සෙකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ............... ................... හා .................................... වැනි දින දරණ මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පරිපාටිය අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

16. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (*ගැසට් නිවේදනයේ* 10 (ඇ) ඡේදය පරිදි විය යුතු ය.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................................................................ (අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්,........................... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තබන ලද බවත් මම සහතික කරමි.

—————,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :—————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවකින් සහතික කළ යුතුයි.)

17. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................................................................... මයා/මිය/මෙනවිය මධ්‍යම රජය යටතේ වන/පළාත් සභාව යටතේ වන ............................................................ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ .......................................... .............................................. තනතුරක සේවය කරන බව ද, 2016.12.14 දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද, එම කාල සීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බව ද, *ගැසට් නිවේදනයේ* 2.1 වන ඡේදයට අනුව අවුරුදු ............................. (පහක/දහයක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත බව ද, අදාළ *ගැසට් නිවේදනයේ* සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී මෙම අයදුම් පත්‍රය අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

—————,
(දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/බලයලත්
නිලධාරියාගේ අත්සන)

දිනය :—————.

නම :—————.
පදවි නාමය :—————.
දිනය :—————.
(නිල මුද්‍රාවකින් සහතික කළ යුතු ය)

11-857/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.